**කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**
**5/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02.**

ප්‍රදායකයා : IFAD/ USAID
සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය : ඇ.ඩො. මිලියන 40.27
ආරම්භක දිනය : 06.11.2007
අවසන් දිනය : 2014 දෙසැම්බර්

**වැඩසටහන් විස්තරය**

මොණරාගල ප්‍රදේශයෙහි අන්තර් කලාපීය කොට්ඨාශයන්හි රබර් වගාවෙහි නියැලීමට අපේක්ෂා කරන උස්බිම් ආහාර බෝග වගාවන්හි නියුතු දුගී ගොවීන් හා මැදරට ප්‍රදේශයේ ආන්තිකත්වයට පත් කුඩා තේ වගා කරුවන්ගේ ජීවනෝපායයන් වර්ධනය කිරීම වැඩ සටහනෙහි ඉලක්කය වේ. මේ තුළ අ) ප්‍රජා සංවර්ධනය හා ග්‍රාමීය ආයතන ගොඩ නැගීම ආ) බැහැර වගා කරුවන් හා බෝග විවිධාංගීකරණ සංවර්ධනය ඇ) පිරිසැකසුම් හා අලෙවි සංවර්ධනය ඈ) ග්‍රාමීය ණය හා ක්ෂුද්‍ර ණය පහසුකම් ඉ) වැඩ සටහන් කළමනාකරණය සඳහා සංරචකයන් ඇතුලත්ය. තේ හා රබර් යන වගාවන් සඳහා බැහැර වගාකරු පද්ධතීන් සංවර්ධනය හා විවිධාංගීකරණය සඳහා සහාය වීමද මේ යටතේ සිදුකෙරේ. යෙදවුම් සැපයීම, ව්‍යාප්ති කටයුතු හා අලෙවිය මෙන්ම ඉතිරි කිරීමේ හා ණය පහසුකම්, ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් හා සමාජ සංවර්ධන කටයුතු ආදියට සම්බන්ධිත ගොවි හා ප්‍රජා කණ්ඩායම් සංවිධානයද කෙරෙනු ඇත. පිරිසැකසුම හා අලෙවිය හා සමඟ ගොවි කණ්ඩායම්වල සම්බන්ධතාවයන් කළමනාකරණය වැඩි දියුණු කෙරෙනු ඇත. පුද්ගලික අංශය හා කළමනාකරණ ගිවිසුම් තුළින් තේ කම්හල් කළමනාකරණය වැඩි දියුණු කෙරෙනු ඇති අතර, තෝරා ගත් කම්හල් නවීකරණය සඳහා සහාය වීම සිදු කෙරේ. රබර් සංවර්ධනය සඳහා පුද්ගලික අංශයේ සහභාගිත්වය තහවුරු කොට ඇත. අවශ්‍ය මූල්‍ය සම්පත් වෙත තිරසාර ප්‍රවිෂ්ඨයක් සහතික කරනු වස් ගොවි සංවිධාන සහ ග්‍රාමීය කණ්ඩායම් මූල්‍ය ආයතන වෙත සම්බන්ධ කෙරෙනු ඇත.

**වැඩසටහනෙහි ප්‍රතිලාභ**

ගොවි පවුල් 26,800 (පුද්ගලයින් 134,000) පමණ තේ, රබර් හා විවිධාංගීකරණ බෝග නිෂ්පාදනය කරමින් වැඩ සටහන් ක්‍රියාකාරකම්වලට සහභාගී වනු ඇත. ග්‍රාමීය ආයතන, පුද්ගලික අංශය හා මූල්‍ය ආයතන සමඟ සහභාගිත්වයෙන් යුතුව යෙදවුම් සැපයුම, ව්‍යාප්ති කටයුතු, පිරිසැකසුම්, අලෙවිය හා මූල්‍යකරණ කටයුතු සිදු කරනු ඇත. මත් පැනට අබ්බැහිය හා ජනවාර්ගික එකමුතුම වැනි ප්‍රධාන සමාජයීය ප්‍රශ්න ආමන්ත්‍රණය කෙරෙනු ඇත.

**සම්බන්ධවිය හැකි පුද්ගලයන්**

| නම | දුරකථන අංකය | ෆැක්ස් | ඊ - මේල් |
|---|---|---|---|
| ව්‍යාපෘති සමායෝජක, | 011 2304130 | 32342010 | addlsdmpi@sltnet.lk |